දශම එකයි හත (USD 119,561.17) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2015 මාර්තු මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී අංක 927 බැඳුම්කරය මගින් සුරැකුම් කරන ලද සහ එකී අංක 927 දරන බැඳුම්කරය යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන ඇමරිකානු ඩොලර් එක් ලක්ෂ අට දහස් පන්සිය හතලිස් දෙක (USD 108,542.00) ක මුදල මත වසරකට සියයට හත (7%) පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද ප්‍රධාන පනතේ 4 වන වගන්තිය අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී අංක 927 දරන බැඳුම්කරය යටතේ බැංකුවට උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන වෙළඳ තොග බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට ප්‍රධාන පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ."

### දේපළ පිළිබඳ විස්තරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, (ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ වූ) හික්කඩුව, කලුපේ, ''වික්‍රම විලා'' හි පිහිටි ඩී ඇන්ඩ් ජී ස්පයිස් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් දරන පරිශ්‍රය තුළ තබා ඇති හෝ ගබඩා කර ඇති කුරුඳු තොග ඇතුළු සෑම සහ සියලු අකාරයකම වෙළඳ තොග, වෙළඳ භාණ්ඩ සහ නිමි භාණ්ඩ සහ වෙනත් සෑම ආකාරයකම චංචල දේපළ සහ ණයට ගන්නා විසින් කලින් කල ගෙනෙනු ලබන හෝ ඉහත කී පරිශ්‍රය මත ගබඩා කර ඇති හෝ තබා ඇති සෑම ආකාරයකම වෙළඳ තොග මෙන්ම ණයට ගන්නා විසින් වෙළඳ කටයුතු පවත්වා ගෙන යන වෙනත් ස්ථානයක තබා ඇති සව්කර ඇති ගබඩා කර ඇති සෑම ආකාරයකම වෙළඳ තොග වේ. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ චංචල 64/67 සහ ST4/246 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

05-173/2

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2013.05.15 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. එස්. කේ. අතුකෝරළ විසින් සහතික කරන ලද 2012.09.05 දිනැති අංක 712 දරන උකස් බැඳුම්කරයට අනුව 2014.10.16 දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් දෙකෝටි අසූතුන් ලක්ෂ විසිහතර දහස් පන්සිය පහළොවයි ශත පනස් හතක (රු. 28,324,515.57) මුදල සමග රුපියල් එක්කෝටි අනූඅට ලක්ෂ අනූ එක් දහස් නවසිය හැත්තෑ එකයි ශත අනූ අටක (රු. 19,891,971.98) මුදල මත වසරකට සියයට දහහතක් (17%) බැගින් පොළියක් ද, 2015.03.07 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් රුවන්වැල්ල, අම්පාගල වැකඩ, පදිංචි ඩබ්. කේ. සුමනතිලක මහතා සහ ඩබ්. කේ. සී. සුමනතිලක මහතා වෙතින් අයවිය යුතුව ඇත.

2012.09.05 දිනැති අංක 712 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් දෙකෝටි අසූතුන් ලක්ෂ විසිහතර දහස් පන්සිය පහළොවයි ශත පනස් හතක (රු. 28,324,515.57) මුදල සමග 2015.03.07 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදලක් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාරේ, අංක 24හි පදිංචි ෂොක්මන් සහ සමරවික්‍රම වෙන්දේසිකාර ආයතනයේ වෙන්දේසිකරු නවින්ද සමරවික්‍රම මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකුවේ, රුවන්වැල්ල ශාඛාවේ, කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් කෝරළේ, මෙගොඩපොත පත්තුවේ, රුවන්වැල්ල ග්‍රාමයේ පිහිටි මහවත්ත (කොටස) නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. ටී. විජයවර්ධන විසින් සාදන ලද 2011.08.28 දිනැති අංක 350 දරන පිඹුරෙහි ලොට් 1A ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : බලයලත් මිනින්දෝරු ඒ. ඒ. රූපසිරි ආනන්ද විසින් සාදන ලද අංක 3860 දරන පිඹුරෙහි ලොට් 1හි කොටසක් සහ ලොට් 2 ද, නැගෙනහිරට : එකී 3860 දරන පිඹුරෙහි ලොට් 1 හි කොටසක් ද, දකුණට : බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද අංක 491 දරන පිඹුරෙහි මහවත්ත (කොටසක්) ලොට් 6 ද, බස්නාහිරට : එකී අංක 491 දරන පිඹුරෙහි ලොට් 6හි (කොසටක් වන) මහවත්ත ද මායිම්ව පර්චස් හතයි දශම හතරයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 7.40) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි අටයි හතක (හෙක්. 0.0187) බිම් ප්‍රමාණයකින් සමන්විත වන අතර එහි ඇති ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ S232/31 හි ලියාපදිංචි කර ඇත.

එකී රුවන්වැල්ල පිහිටි මහවත්ත (කොටස) නමැති ඉඩම අංක 350 දරන එකී පිඹුරෙහි ලොට් 2 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : එකී අංක 3860 දරන පිඹුරෙහි ලොට් 1හි ද, නැගෙනහිරට : ප්‍රධාන පාර ද, දකුණට : එකී අංක 3860 දරන පිඹුරෙහි ලොට් 1හි කොටසක් සහ එකී අංක 350 දරන පිඹුරෙහි ලොට් අංක 1A ද, බස්නාහිරට : එකී අංක 3860 දරන පිඹුරෙහි ලොට් 1 ද මායිම්ව පර්චස් දෙකයි දශම අටයි එකක (අ. 0, රූ. 0, පර්. 2.81) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි හතයි එකක (හෙක්. 0.0071) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ S232/32 හි ලියාපදිංචි කර ඇත.

ලොට් 1A සහ ලොට් 2 (පාර) ලෙස දක්වා ඇති එකී ඉඩම් කැබලි පිඹුරු අංක 2707/26හි ඒකාබද්ධ කරන ලද ලොට් 1හි බෙදූ කොටස් සහ මෙහි පහත වඩාත් පූර්ණ වශයෙන් විස්තර කර ඇති පිඹුරු අංක 3860 හි ලොට් 1හි කොටසක් වේ.

1. එකී රුවන්වැල්ල ග්‍රාමයෙහි පිහිටි මහවත්ත (කොටස) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඒ. රූපසිරි ආනන්ද විසින් සාදන ලද 2007.07.26 දිනැති අංක 2707/26 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද අංක 491 දරන පිඹුරෙහි ලොට් 4 ද, නැගෙනහිරට : එකී අංක 491 දරන පිඹුරෙහි ලොට් 4 ද, දකුණට : එකී අංක 491 දරන පිඹුරෙහි ලොට් 4 ද, බස්නාහිරට : එකී අංක 491 දරන පිඹුරෙහි ලොට් 4 ද මායිම්ව පර්චස් පහයි දශම පහයි දෙකක (අ. 0, රූ. 0, පර්. 5.52) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති වෙනත් සියලු දේ ද වේ. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ S201/217 හි ලියාපදිංචි කර ඇත.

2. එකී රුවන්වැල්ල ග්‍රාමයේ පිහිටි මහවත්ත (කොටස) නමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. රූපසිරි ආනන්ද විසින් සාදන ලද 1995.05.24 දිනැති අංක 3860 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා ඇති සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : එකී අංක 491 දරන පිඹුරෙහි මහවත්තෙහි කොටසක් (ලොට් 3) ද, නැගෙනහිරට : රුවන්වැල්ල සිට කරවනැල්ල දක්වා වූ ප්‍රධාන පාර ද, දකුණට : මහවත්තෙහි කොටසක් (එකී අංක 491 දරන පිඹුරෙහි ලොට් 6) ද, බස්නාහිරට : එකී අංක 491 දරන පිඹුරෙහි මහවත්තෙහි කොටසක් (ලොට් 6 හා 3) ද මායිම් ව පර්චස් දහතුනයි දශම එකයි අටයි හතයි පහක (අ. 0, රූ. 0, පර්. 13.1875) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි තුනයි හයක (හෙක්. 0.0336) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති වෙනත් සියලු දේ ද වේ. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි S205/209හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. වී. ඩී. ජී. වික්‍රමරත්න,
කළමනාකරු.

2015 මාර්තු මස 07 වැනි දින,
ලංකා බැංකුව,
රුවන්වැල්ල.

05-153

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කටුනේරිය ශාඛාව**
**(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

ගිණුම් අංකය : 0550-32553896-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.01.23 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව්9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. සුනේත්‍රා එන්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2012 ඔක්තෝබර් 18 දිනැති අංක 1207 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම්, කටුනේරිය ව්‍යාපාර ලියාපදිංචි සහතික අංක 26/1541 යටතේ හේෂර එන්ටර්ප්‍රයිසර්ස් යන නාමය විලාශය සහ අභිධානය යටතේ ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන ජයසූරිය කුරනගේ වසන්ත ක්‍රිස්ටෝ පෙරේරා යන අය බන්ධනදායී වශයෙන් රුපියල් දෙකෝටි විසිලක්ෂ එකොලොස්දහස් හත්සිය අසූපහයි ශත තිස් එකක (රු. 22,011,785.31) මුදලක් 2014 නොවැම්බර් මස 12 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 22,011,785.31 මුදල සහ 2014 නොවැම්බර් 13 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විස්ස (20%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1207 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර චන්දිමා ප්‍රියදර්ශනී ගමගේ මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසය තුළ මැද පළාත දකුණු පිටිගල් කෝරළේ, නාත්තන්ඩිය දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසයේ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුදුකොටුව උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාස 510හි මුදුකටුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ටී. කේ. ධනසේන විසින් සාදන ලද 2007.10.23 දිනැති අංක 4231 දරන සැලැස්මේ නිරූපනය වන මාරගහවත්ත හෙවත් තලගහවත්ත සහ මුදුකටුවයාය නමැති ඉඩමේ ලොට් 01 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර (පීඑස්) මුහුදු වෙරළ පාරේ සිට (අධි වේගී) වඩාත් නිවැරදිව පාර (පීඑස්) මුහුදු වෙරළේ සිට (අධිවේගී) සහ ඩබ්ලිව් පී. නිශාන්ති රේනුකා ප්‍රනාන්දු, ටී. ඒ. හැරියට් පෙරේරා සහ ඩබ්ලිව්. මාර්තා මාරියා ප්‍රනාන්දු යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, නැගෙනහිරට : ඩබ්ලිව්. පී. නිශාන්ති රේනුකා ප්‍රනාන්දු සහ ඩබ්ලිව්. පියස් බෙනඩික්ට් ප්‍රනාන්දු විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, දකුණට : කේ. මධුශානී ශාන්තිනී පෙරේරා විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එම්. ඩී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1992.08.03 දිනැති අංක 8913 සැලැස්මේ සඳහන් ලොට් 01, බලයලත් මිනින්දෝරු ටී. කේ. ධනසේන විසින් සාදන ලද 2001.07.23 දිනැති අංක 2743 දරන සැලැස්මේ සඳහන් ලොට් 02 සහ ඩබ්ලිව්. මර්තා මාරියා ප්‍රනාන්දු විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් තිස් නවයයි දශම දෙකක් (අ. 0. රූ. 1, පර්. 39.2) ක් විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැව් මෙය,
සහකාර සාමාන්‍යාධිකාරිනි - නීති.

05-139

---

**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (සංශෝධිත) 4 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2015ක් වූ මාර්තු මස 23 වැනි දින පැවැත්වූ රැස්වීමකදී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

"නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. අනුරුද්ධිකා (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2010.06.17 දිනැති අංක 827, 2011.01.05 දිනැති අංක 925, 2011.01.21 දිනැති අංක 937, 2012.09.27 දිනැති අංක 1276 සහ අංක 1278 දරන උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සිය ලියාපදිංචි කාර්යාලය හික්කඩුවේ පිහිටි 2007 අංක 07 දරන සමාගම්

පනත යටතේ යථා පරිදි ලියාපදිංචි කරන ලද සමාගමක් වන ඩී ඇන්ඩ් ජී ස්පයිස් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

තවද හික්කඩුවේ පදිංචි දිනමුනි සවිත්‍රි වික්‍රමරත්න (විවාහයට පෙර මෙන්ඩිස්) සහ දිනේෂා චාමිනි වික්‍රමරත්න යන අය විසින් -

(i) මෙහි පහත උපලේඛනයේ I කොටසේ විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය සඳහා වන සිය නිදහස් අයිතිවාසිකම් හිමිකම් සහ එකී අංක 827 සහ අංක 925 දරන උකස් බැඳුම්කරයන් යටතේ ද,

(ii) මෙහි පහත උපලේඛනයේ II කොටසේ විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය සඳහා වන සිය නිදහස් අයිතිවාසිකම් හිමිකම් සහ එකී අංක 937 සහ අංක 1278 දරන උකස් බැඳුම්කරයන් යටතේ ද,

(iii) මෙහි පහත උපලේඛනයේ III කොටසේ විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය සඳහා වන සිය නිදහස් අයිතිවාසිකම් හිමිකම් සහ එකී අංක 1276 දරන උකස් බැඳුම්කරයන් යටතේ ද,

බැංකුවට උකස්කර ඇති හෙයින් ද,

තවද වර්ෂ 2015 පෙබරවාරි මස 28 වැනි දිනට එකී බැඳුම්කරයන් යටතේ බැංකුවට ඇමරිකානු ඩොලර් හාරලක්ෂ හැටනව දහස් අටසිය හැත්තෑ පහයි දශම තුනයි අට (USD 469,875.38) ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද,

සංශෝධනය කරන ලද 1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යටතේ බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතල වලට අනුව එකී ඇමරිකානු ඩොලර් හාරලක්ෂ හැට නව දහස් අටසිය හැත්තෑ පහයි දශම තුනයි අට (USD 469,875.38) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2015 මාර්තු මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා-

(i) එකී අංක 827 සහ අංක 925 දරන බැඳුම්කරයන් මගින් සුරැකුම් කරන ලද සහ එකී අංක 827 සහ අංක 925 දරන බැඳුම්කරයන් යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන ඇමරිකානු ඩොලර් දෙලක්ෂ හතලිස් දෙදහස් හතලිස් අට (USD 242,048.00) ක මුදල මත

(ii) එකී අංක 937 සහ අංක 1278 දරන බැඳුම්කරයන් මගින් සුරැකුම් කරන ලද සහ එකී අංක 937 සහ අංක 1278 දරන බැඳුම්කරයන් යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන ඇමරිකානු ඩොලර් අනූ දෙදහස් දෙසිය හැට එක (USD 92,261.00) ක මුදල මත

(iii) එකී අංක 1276 දරන බැඳුම්කරය මගින් සුරැකුම් කරන ලද සහ එකී අංක 1276 දරන බැඳුම්කරය යටතේ බැංකුවට හිඟව පවතින මුදල වන ඇමරිකානු ඩොලර් අනූ දෙදහස් දෙසිය හැටඑක (USD 92,261.00) ක මුදල මත

වසරකට සියයට විසි එකක (21%) පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද, ප්‍රධාන පනතේ 4 වන වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එයද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී අංක 827, අංක 925, අංක 937, අංක 1278 සහ අංක 1276 දරන බැඳුම්කරයන් යටතේ බැංකුවට උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ I, II සහ III කොටස් වල විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට ප්‍රධාන පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතල වලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.”'

### දේපළ පිළිබඳ විස්තරය

1 කොටස :

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, කලුපේ පිහිටි හුන්නන්ගේ පිට්ටනිය වත්තෙහි ලොට් A ලෙස හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක ඩබ්ලිව්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් සාදන ලද 2010.03.31 දිනැති අංක 57A දරන පිඹුරෙහි ලොට් A2 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස උතුරට : පන්සල අද්දර වත්තෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 57A/2010 හි ලොට් A3 න් සහ අලුත්වල සිට තොටගමුව තෙක් දිවෙන උස් මාර්ගයෙන් ද, දකුණට : අලුත්වල සිට තොටගමුව තෙක් දිවෙන උස් මාර්ගයෙන් ද සහ බටහිරට : පිඹුරු අංක 57A/2010 හි ලොට් A1 න් ද මායිම්වන අතර ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විස්සක් (අ. 0, රූ. 2, පර්. 20) වේ.

ඉහත විස්තර කරන ලද ඉඩම පහත සඳහන් ඉඩමෙහි නැවත මැනීමක් සහ උප බෙදුමක් වේ.-

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, කලුපේ පිහිටි හුන්නන්ගේ පිට්ටනිය වත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක බී. එච්. ඒ. ද සිල්වා විසින් සාදන ලද 1993.04.22 දිනැති අංක 1338 දරන පිඹුරෙහි ලොට් A ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස උතුරට : පන්සල අද්දර වත්තෙන් ද, නැගෙනහිරට : තල්ලිය වත්තෙන් ද, දකුණට : අද්දර වත්තෙන් ද සහ බටහිරට : හොරාගේ වත්තෙන් ද මායිම්වන අතර ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් දොළහයි දශම පහ (අ. 1, රූ. 3, පර්. 12.5) ක් වේ.

ඉහත විස්තර කරන ලද ඉඩම පහත සඳහන් ඉඩමෙහි නැවත මැනීමක් වේ :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ,කලුපේ පිහිටි හුන්නන්ගේ පිට්ටනිය වත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම උතුරට : පන්සල අද්දර වත්තෙන් ද, නැගෙනහිරට : තල්ලිය වත්ත හෙවත් හේනගේ වත්තෙන් ද, දකුණට : අද්දර වත්තෙන් ද, බටහිරට : හොරාගේ වත්තෙන් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් අක්කර දෙකක් පමණ (අ. 2, රූ. 0, පර්. 0) ක් වන අතර මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C661/91හි ලියාපදිංචි වී ඇත.

2. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, කලුපේ පිහිටි හුන්නන්ගේ පිට්ටනිය වත්තෙහි ලොට් A ලෙස හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක ඩබ්ලිව්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් සාදන ලද 2010.03.31 දිනැති අංක 57A/2010 දරන පිඹුරෙහි ලොට් A1 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස උතුරට : පන්සල අද්දර වත්තෙන් ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් A2න් ද, දකුණට : අලුත්වල සිට තොටගමුව තෙක් දිවෙන උස් මාර්ගයෙන් ද සහ බටහිරට : නාගරුක්කාරාම පාරෙන් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විස්සක් (අ. 0, රූ. 2, පර්. 20) වන අතර මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C875/120හි ලියාපදිංචි වී ඇත.

3. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, කලුපේ පිහිටි හුන්නන්ගේ පිට්ටනිය වත්තෙහි ලොට් A ලෙස හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක ඩබ්ලිව්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් සාදන ලද 2010.03.31 දිනැති අංක 57A/2010 දරන පිඹුරෙහි ලොට් A3 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස උතුරට : පන්සල අද්දර වත්තෙන් ද, නැගෙනහිරට : තල්ලිය වත්තෙන් ද, දකුණට : අලුත්වල සිට තොටගමුව තෙක් දිවෙන උස් මාර්ගයෙන් ද සහ බටහිරට : එම ඉඩමේ

ලොට් A2න් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විස්සක් (අ. 0, රූ. 1, පර්. 20) වේ.

4. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, කලුපේ පිහිටි හුන්නන්ගේ පිට්ටනිය වත්තෙහි ලොට් A ලෙස හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක ඩබ්ලිව්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් සාදන ලද 2010.03.31 දිනැති අංක 57A/2010 දරන පිඹුරෙහි ලොට් A4 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස උතුරට : අලුත්වල සිට තොටගමුව තෙක් දිවෙන උස් මාර්ගයෙන් ද, නැගෙනහිරට : තල්ලිය වත්තෙන් ද, දකුණට : අද්දර වත්තෙන් ද සහ බටහිරට : අද්දර වත්තෙන් සහ අලුත්වල සිට තොටගමුව තෙක් දිවෙන උස් මාර්ගයෙන් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් පර්චස් තිස් දෙකයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 32.5) වේ.

ඉහත විස්තර කරන ලද ලොට් A3 සහ A4 පහත විස්තර කරන ඉඩමේ කොටස් වේ :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, කලුපේ පිහිටි හුන්නන්ගේ පිට්ටනය වත්තෙහි ලොට් A ලෙස හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක ඩබ්ලිව්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් සාදන ලද 2010.03.31 දිනැති අංක 57A/2010 දරන පිඹුරෙහි ලොට් A3 සහ A4 ලෙස ලකුණු කර ඇති ඒකාබද්ධ කරන ලද ඉඩම් කොටස් උතුරට : පන්සල අද්දර වත්තෙන් ද, නැගෙනහිරට : තල්ලිය වත්තෙන් ද, දකුණට : අද්දර වත්තෙන් ද සහ බටහිරට : එම ඉඩමේ ලොට A2න් ද සහ පාරෙන් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දොලහයි දශම පහ (අ. 0, රූ. 2, පර්. 12.5) ක් වේ. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C875/121හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී ඉඩම් මත පිහිටි සෑම සහ සියලු ගොඩනැගිලි පරිශ්‍රය, නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, සවි කිරීම්, ඇමුණුම්, සේවා සහ විදුලිය සැපයීමේ පද්ධති, ජලය සැපයීමේ උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායු සමනය කිරීමේ උපකරණ ඇතුළුව වේ.

II කොටස :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ ගාලු පියැද්දේ පෙට්ටිගල ඇල අද්දර බණ්ඩාරවත්ත ලෙස හඳුන්වනු ලබන ඉඩමෙහි ලොට් 4 සහ පෙට්ටිගලබොඩ බණ්ඩාරවත්ත ලෙස හඳුන්වනු ඉඩමෙහි ලොට් 2, 3 සහ 5 දරන ඒකාබද්ධ ඉඩම් සහිත ලොට් A යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි (ගාලු දිසා අධිකරණ බෙදුම් නඩු අංක 34765 හි නඩු වාර්තාවේ ගොනු වී ඇති බලයලත් මානක වී. එල්. ඩී. අබේගුණවර්ධන විසින් සාදන ලද 1938.06.07 දිනැති අංක 3069 දරන පිඹුරෙහි පෙන්වා ඇති) බලයලත් මානක යූ. වේවැල්ල විසින් සාදන ලද 2009.07.15 දිනැති අංක 1333 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස උතුරට : පෙට්ටිගල ඇල හරහා පිහිටි මහ නගර සභා පාරෙන් ද, නැගෙනහිරට : ඉහත කී පිඹුරු අංක 1333හි ගලෙට් 2න් සහ ලොට් 3න් (අඩි 12ක් පළල පාර) දකුණට : ගාල්ල දිසා අධිකරණ නඩු අංක 34766 හි ගොනුවේ ඇති අංක 2594A දරන පිඹුරෙහි ලෙට් 1න් ද සහ බටහිරට : ලොට් 19496 සහ ඒඩ්‍රියන් ජැන්ස්ට අයත් ඉඩමෙන් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකයි දශම හතයි පහ (අ. 0, රූ. 0, පර්. 22.75) ක් වේ. ඉහත කී ඉඩම් මත පිහිටි සෑම සහ සියළු ගොඩනැගිලි, පරිශ්‍රය, නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, සවි කිරීම්, ඇමුණුම්, සේවා සහ විදුලිය සැපයීමේ පද්ධති, ජලය සැපයීමේ උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායු සමනය කිරීමේ උපකරණ ඇතුළුව වේ.

III කොටස :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වලල්ලාවිට කෝරළේ, බෙන්තොට, කොසේගාඩ, අහුංගල්ලේ පිහිටි ලක්මුණි ගෙදර වත්ත, වෙද උපකාරගේ වත්ත, සිපෝනා පදිංචිවළුන් වීරපනිච්චිගෙදර වත්ත, අඹගහවත්ත හෙවත් දොතගේවත්ත මල්ලව්බෝවිස්ලාගේ මාවත වත්ත යනුවෙන් හඳුන්වන ඉඩමෙහි බලයලත් මානක ඩී. ජී. මෙන්ඩිස් විසින් සාදන ලද 2003.07.05 දිනැති අංක 6055 දරන පිඹුරෙහි ලොට් 6 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස උතුරට : එම ඉඩමේ ලොට් 1න් ද, නැගෙනහිරට : එම ඉඩමේ ලෙට් 7න් ද (පාර), දකුණට : ලොට් 5 සහ වීරපත්තිනිගෙදර වත්ත, මාවත වත්ත සහ අඹගහවත්ත යන ඉඩම්වලින්ද සහ බටහිරට : ලෙට් 1AD වලින් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් පර්චස් තිස් එකයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 31.5) ක්වන අතර මෙය බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B471/249හි ලියාපදිංචි වී ඇත.

පහත සඳහන් මාර්ගය මතින් වූ මාර්ග අයිතිය ඇතුළුව.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වලල්ලාවිට කෝරළේ, බෙන්තොට, කොසේගාඩ, අහුංගල්ලේ පිහිටි ලක්මුණි ගෙදර වත්ත, වෙද උපකාරගේ වත්ත, සිපෝනා පදිංචිවළුන් වීරපනිච්චිගෙදර වත්ත, අඹගහවත්ත හෙවත් දොතගේවත්ත මල්ලව්බෝවිස්ලාගේ මාවත වත්ත යනුවෙන් හඳුන්වන ඉඩමෙහි බලයලත් මානක ඩී. ජී. මෙන්ඩිස් විසින් සාදන ලද 2003.07.05 දිනැති අංක 6055 දරන පිඹුරෙහි ලොට් 7 (අඩි 10ක් පළල පාර) ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස උතුරට : රාජපක්ෂ මාවතෙන් ද, නැගෙනහිරට : ලොට් 2, 3, 4 සහ 5න් ද, දකුණට : ලොට් 5 න් ද සහ බටහිරට : ලෙට් 1, 5 සහ 6 න් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් පර්චස් නමයයි දශම දෙකයි පහ (අ. 0, රූ. 0, පර්. 9.25) ක්වන අතර මෙය බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B471/249හි ලියාපදිංචි වී ඇත.

පහත සඳහන් මාර්ගය මතින් වූ මාර්ග අයිතිය ඇතුළුව

ඉහත කී ඉඩම් මත පිහිටි සෑම සහ සියළු ගොඩනැගිලි, පරිශ්‍රය, නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, සවි කිරීම්, ඇමුණුම්, සේවා සහ විදුලිය සැපයීමේ පද්ධති, ජලය සැපයීමේ උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායු සමනය කිරීමේ උපකරණ ඇතුළුව වේ.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

05-173/1

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2015** | | | |
| මැයි | 2015.05.08 | සිකුරාදා | 2015.04.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.05.15 | සිකුරාදා | 2015.04.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2015.05.22 | සිකුරාදා | 2015.05.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.05.29 | සිකුරාදා | 2015.05.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2015.06.05 | සිකුරාදා | 2015.05.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.12 | සිකුරාදා | 2015.05.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.19 | සිකුරාදා | 2015.06.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.26 | සිකුරාදා | 2015.06.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2015.07.03 | සිකුරාදා | 2015.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.10 | සිකුරාදා | 2015.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.17 | සිකුරාදා | 2015.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.24 | සිකුරාදා | 2015.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.30 | බ්‍රහස්පතින්දා | 2015.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.